දිවි අහිමි කරගැනීමේ පුවත් වාර්තා කිරීමේදී, මාධ්‍ය විසින් ඒ සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්මයන් නිරතුරුවම පිළිපැදීම අත්‍යාවශ්‍ය වේ. මන්දයත්, ආචාර ධාර්මික ලෙසින් දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම ඔස්සේ එම සමාජ ගැටළුව වෙත ආමන්ත්‍රණය කිරීමටත්, එම වාර්තාකරණය නිසා තවත් ජීවිතයක් දිවි අහිමි කරගැනීමක් ලෙසින් නැතිවී යෑමට ඇති ඉඩ අවම කිරීමටත් හැකි බැවිනි.

දිවි අහිමි කරගැනීමට පාදක වූ කරුණ සරලව නොදැක්විය යුතු යැයි එම ආචාර ධර්මයන්හි දැක්වෙන්නේ, දිවි අහිමි කරගැනීමක් පසුපස සංකීර්ණ කරුණු ගණනාවක් පැවතිය හැකි නිසායි. එසේම දිවි අහිමි කරගත් ආකාරය පළ නොකළ යුතු බව සහ දිවි අහිමි කරගත් ආකාරය දීර්ඝ ලෙස විස්තර කිරීම නොකළ යුතු බව දැක්වෙන්නේ, ඒ ඔස්සේ තවත් අයෙකු එම ආකාරය භාවිතා කොට දිවි අහිමි කරගැනීමට නැඹුරු වීමේ හැකියාවක් ඇති නිසායි.

මීට අමතරව, උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු ඊට යොමු කිරීම ඔස්සේ එම ජීවිතය බේරාගැනීමට ඉඩක් විවෘත වනු ඇත.

පොලිස් වාර්තාවන්ට අනුව 2019 වසරේ ශ්‍රී ලංකාවේ වාර්තා වූ දිවි අහිමි කරගැනීම් සංඛ්‍යාව 3,135 යි. එනම් සාමාන්‍යයක් ලෙසින් ගත් විට දිනකට සිදුවී ඇති දිවි අහිමි කරගැනීම් 8.5 යි. දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම මනා ප්‍රවේසමකින් සහ ආචාර ධාර්මික ප්‍රවේශයකින් යුතුව සිදු කරන ලෙසට අපි නිරන්තරයෙන්ම මාධ්‍ය වෙත සිහිකැඳවීම් කරන්නේ ඒ නිසායි.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://www.police.lk/index.php/item/138

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

https://accountablejournalism.org/.../australia-standards...

**#MediaEthicsSL #lka #SinhalaPress #Dinamina #Mawbima**